**ශීර්ෂ 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1.1 විගණන විෂය පථය**

---

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත 2015 නොවැම්බර් 06 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,148 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,087.96 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් රු.මිලියන 60 ක් හෙවත් සියයට 2 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 2,010.33 | 2,002.41 | 7.92 | 0.39 |
| මුලධන | 1,137.67 | 1,085.55 | 52.12 | 4.58 |
| **එකතුව** | **3,148.00** | **3,087.96** | **60.04** | **1.91** |

## 2.2 ආදායම් ගිණුම්

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්

2014 වර්ෂය සඳහා ආදායම් සංකේත 23 ක් සඳහා එකතුව රු.මිලියන 605,330 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 485,387 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 80 ක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන්දීමේ නිලධාරි | ආදායම් සංකේතය | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | තථ්‍ය ආදායම | (අඩුවෙන් එකතුකිරීම)/ වැඩියෙන් එකතුකිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 10.02.01.01 | 25,000.00 | 24,436.88 | (563.12) | 98 |
| - එම- | 10.02.01.02 | 80,000.00 | 65,756.16 | (14,243.84) | 82 |
| - එම- | 10.02.01.03 | 50,000.00 | 45,441.70 | (4,558.30) | 91 |
| - එම- | 10.02.01.04 | 135,000.00 | 102,280.68 | (32,719.32) | 76 |
| - එම- | 10.02.02.01 | - | 2.31 | 2.31 | |
| - එම- | 10.02.02.02 | - | 1.15 | 1.15 | |
| - එම- | 10.02.03.01 | - | 13.77 | 13.77 | |
| - එම - | 10.02.09.00 | 30.00 | 472.18 | 442.18 | 1,574 |
| - එම - | 10.02.12.01 | 15,000.00 | 17,600.15 | 2,600.15 | 117 |
| - එම- | 10.02.12.02 | 11,600.00 | 10,893.87 | (706.13) | 94 |
| - එම- | 10.02.12.03 | 19,000.00 | 16,089.10 | (2,910.90) | 85 |
| - එම- | 10.03.03.00 | 1,500.00 | 815.17 | (684.83) | 54 |
| - එම- | 10.03.04.00 | 2,200.00 | 2,048.05 | (151.95) | 93 |
| - එම- | 10.03.05.00 | 1,000.00 | 841.83 | (158.17) | 84 |
| - එම- | 10.03.09.00 | 600.00 | 579.47 | (20.53) | 97 |
| - එම- | 10.04.01.01 | 98,000.00 | 81,643.76 | (16,356.24) | 83 |
| - එම- | 10.04.01.02 | 12,000 .00 | 10,365.56 | (1,634.44) | 86 |
| - එම- | 10.04.01.03 | 100.00 | 19.00 | (81.00) | 19 |
| - එම- | 10.04.04.00 | 8,400.00 | 6,154.51 | (2,245.49) | 73 |
| - එම- | 10.04.02.01 | 28,000.00 | 22,296.67 | (5,703.33) | 80 |
| - එම- | 10.04.03.01 | 107,400.00 | 69,402.27 | (37,997.73) | 65 |
| - එම- | 10.04.03.99 | 500.00 | 214.34 | (285.66) | 43 |
| - එම- | 10.04.02.99 | 10,000.00 | 8,018.45 | (1,981.55) | 80 |
| **එකතුව** | | **605,330.00** | **485,387.03** | **(119,942.97)** | **80** |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකා රේගුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 24601 | 85.00 | 59.14 | 50.00 | 55.47 | 310.00 | 273.82 |

## 2.4 අග්‍රිම ගිණුම

දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 1.4 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 2,095.16 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පතුවේ නම | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| පොදු තැන්පතු | 6000/0000/00/0015/0126/000 | 57.42 |
| විවිධ තැන්පතු | 6000/0000/00/0014/0003/000 | 2,037.74 |
| **එකතුව** | | **2,095.16** |

**2.6 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරික්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂ 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 447 ප්‍රකාරව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය යාවත්කාලින කර නොතිබුණි.

**3.2 පොදු තැන්පත් ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී ඉංජිනේරු සංස්ථාවට ලබාදී තිබුණු දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව නිම කිරීමේදී වූ ප්‍රමාද වීම වෙනුවෙන් අයකළ රු.25,902,750 ක් ප්‍රමාද ගාස්තු රජයේ ආදායමට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) 2015 අයවැය සම්මන්ත්‍රණයේ ප්‍රවේශපත්‍ර විකිණීමෙන් ලැබී තිබුණු රු.752,500 ක් 2014 රජයේ ආදායම් ගිණුමට බැර නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) 6000-0000-000014-0003-000 දරන පොදු තැන්පත් ගිණුමෙහි 2013වර්ෂයට සහ 2014 වර්ෂයට අදාලව පිළිවෙළින් රු.1,047,477,214 ක් සහ රු.990,267,695 ක් වූ මුද්දර ගාස්තු ආදායම පළාත් සභාවලට නොයවා තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

**3.3 අග්‍රිම ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 සැප්තැම්බර් 20 දින දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය විමර්ශනය කිරීම සඳහා විශ්ව විද්‍යාලයකට ගෙවා තිබුණු රු.1,400,000 ක් වූ අත්තිකාරම් 2015 ජූලි 30 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය කාර්යාලවලට තැපැල් වියදම් සඳහා උප අග්‍රිම නිකුත් කිරීමේදී එම මුදල් උප අග්‍රිමයන් ලෙස නිකුත් නොකර එකතුව රු.14,969,000 ක් දෙපාර්තමේන්තුවේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මුදල් වර්ෂය අවසානයේදී වියදම් නොවූ අග්‍රිම මුදල් භාණ්ඩාගාරයට පියවිය යුතු වුවත්, විධිමත් නොවූ ගිණුම් තැබීම නිසා එම නිරවුල් නොවූ අග්‍රිම අනාවරණය වී නොතිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 371(6) ප්‍රකාර කිසියම් මුදල් වර්ෂයක් සඳහා ලබා දෙන ලද මුදල්, වෙනත් මුදල් වර්ෂයක ගෙවීම් සඳහා යොදා නොගත යුතු වුවත්, එයට පටහැනිව දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

## 3.4 ආදායම් ගිණුම

### 3.4.1 ආදායම් ගිණුම් ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 30 දිනැති අංක 241/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වර්ෂය සඳහා වන ආදායම් ගිණුම් 33 ක් 2015 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම ගිණුම් විගණනයට 2015 අප්‍රේල් 24 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) ආදායම් ගිණුමේ ඇතුළත් කළ යුතු හිඟ ආදායම් පිළිබඳ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් කර තිබුණු ආදායම් ගිණුම් 33 හිම සඳහන් කර නොතිබුණි.

### 3.4.2 ආදායම් ගිණුම් සකස් කිරීමේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) මුද්දර බදුවලින් සමාලෝචිත වර්ෂය තුළ රැස්කරනු ලබන මුළු ආදායම සහ පළාත් සභාවලට ගෙවීම්/මාරු කිරීම් මුද්දර බදු ආදායම් ගිණුම් වල දක්වා නොතිබීම**

---

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව මුද්දර ගාස්තු එකතු කරන ආදායම් ගණන්දීමේ නිලධාරියා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වන අතර 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත ප්‍රකාරව ආණ්ඩුව විසින් මුද්දර බදු වශයෙන් රැස් කරන සියලු ආදායම්, එම ආදායම් එකතුකර ගනු ලැබූ පදනම මත පළාත් සභාවලට මාරු කළ යුතුය. ඒ අනුව මුද්දර බදු වශයෙන් රැස් කරන සියලු ආදායම් මුද්දර බදු ආදායම් වශයෙන්ද පළාත් සභාවලට යවන ලද මුදල, ආපසු ගෙවීම් වශයෙන්ද මුද්දර බදු ආදායම සඳහා වූ ආදායම් සංකේත 10.02.07.00 දරන ආදායම් ගිණුමෙහි දැක්විය යුතු වුවත්, භාණ්ඩාගාරය විසින් බැරකර තිබුණු රු.3,592,693,757 ක මුද්දර බදු ආදායම සහ එම මුදල පළාත් සභාවලට මාරුකිරීම පමණක් ආදායම් ගිණුමෙහි දක්වා තිබුණ නමුත් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු රු.8,334,196,786 ක් වූ මුළු මුද්දර බදු ආදායම සහ එයින් පළාත් සභාවලට මාරු කරන ලද රු.7,343,929,092 ක් එම ආදායම් ගිණුමේ දක්වා නොතිබුණි.

**(ආ) ජාතිය ගොඩනැඟීමේ බදුවලින් සමාලෝචිත වර්ෂය තුළ රැස්කරනු ලබන මුළු ආදායම සහ පළාත් සභාවලට ගෙවීම් /මාරුකිරීම්, ආදායම් ගිණුම්වල දක්වා නොතිබීම**

---

2009 අංක 09 දරන ජාතිය ගොඩනැඟීමේ බදු පනත ප්‍රකාරව ජාතිය ගොඩනැඟීමේ බදු එකතුකිරීමේ ආදායම් ගණන්දීමේ නිලධාරියා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වන අතර 2010 දෙසැම්බර් 29 දිනැති අංක 01/2010 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය අනුව එකතු කරනු ලබන ආදායමෙන් සියයට 33 1/3 ක් පළාත් සභාවලට මාරු කළ යුතුය. ඒ අනුව ජාතිය ගොඩනැඟීමේ බදු වශයෙන් රැස් කරන ලද එකතුව රු.57,681,494,877 ක් වූ මුළු ආදායම ජාතිය ගොඩනැගීමේ දළ ආදායම වශයෙන් ද පළාත් සභාවලට යවන ලද රු.13,098,373,164 ක් වූ මුදල ආපසු ගෙවීම් වශයෙන්ද ජාතිය ගොඩනැඟීමේ බදු ආදායම සඳහා වූ ආදායම් සංකේත 10.02.12.01, 10.02.12.02 හා 10.02.12.03 දරන ආදායම් ගිණුම්වල දැක්විය යුතු වූවද රැස්කරන ලද ජාතිය ගොඩනැඟීමේ බද්දෙන් සියයට 66 2/3 ක් හෙවත් රු.44,583,121,713 ක් වූ ශුද්ධ ආදායම පමණක් එම ආදායම් ගිණුම්වල දක්වා තිබුණි.

**3.4.3 හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් නොකිරීම**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 128(2)(ඇ) ප්‍රකාරව 2014 ජූනි 30 දිනට හා 2014 දෙසැම්බර් 31 දිනට හිඟ රාජ්‍ය ආදායම් පිළිබඳ තත්ත්වය පෙන්නුම් කරන අර්ධ වාර්ෂික වාර්තා පිළිවෙලින් 2014 ජුලි 31 දින හා 2015 ජනවාරි 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම වාර්තා 2015 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පරිගණක ජාලය (Intranet) අනුව 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය කාර්යාලවලට හා පරිගණකගත නොකළ අංශවල හිඟ බදු හැර පරිගණකගත කරන ලද අංශයන්හි එකතුව රු.220,904,830,695 ක් වූ හිඟ බදු පැවතුණි.

### 3.4.4 හිඟබදු කපාහැරීම

2010 අංක 16 දරන ගෙවීම පැහැරහරින ලබන බදු පියවීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8(අ) වගන්තියට අනුව සමාලෝචිත වර්ෂයේදී හිඟ බදුවලින් රු.15,575,382 ක් 2014 ජනවාරි 09 දිනැති අංක 1844/62 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර කපාහැරීමට කටයුතු කර තිබුණි. හිඟ බදු රු.206,587,271 ක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අනුමැතිය මත කපා හැර තිබුණි. එම රු.206,587,271 ක් වූ හිඟබදු ශේෂ පිළිබඳව විගණනයට ඉදිරිපත් කර තිබුණු විද්‍යුත් තැටිය (CD) විවෘත කිරීමට නොහැකි වීම නිසා එහි ඇතුළත් තොරතුරු විගණනය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

### 3.4.5 ආදායම් ඇස්තමේන්තු කිරීම

පහත සඳහන් නිරීක්ෂණකරනු ලැබේ.

(අ) ආදායම් සංකේත 20 ක ට අදාල සමාලෝචිත වර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තු අනුව ආදායමේ එකතුව රු.මිලියන 657,058 ක් වූ අතර පසුව එය එකතුව රු.මිලියන 605,330 ක් දක්වා සංශෝධනය කර තිබුණි. වර්ෂය තුළ රැස්කර තිබුණු තථ්‍ය ආදායම් එකතුව රු.මිලියන 485,387 ක් හෙවත් මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 73.87 ක් සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 80.19 ක් වී තිබුණි. .

(ආ) ආදායම් සංකේත 18 ක සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට වඩා තථ්‍ය ආදායම අඩු වී තිබුණ අතර ආදායම් සංකේත 02 ක සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට වඩා තථ්‍ය ආදායම වැඩි වී තිබුණි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වූ එකතු කළ අගය

මත බදු ආදායම (ආනයන) 2013 වර්ෂයේදී රු.96,590,086,435 ක් වූ අතර 2014 වර්ෂයේදී රු.102,280,685,200 ක් දක්වා වැඩිවී තිබුණි.

(ඈ) රැස්කරන ලද බදු ආදායම (ශුද්ධ) රු.485,387,055,372 ක්වූ අතර එම ආදායමෙන් වෙනත් දෙපාර්තමේන්තු විසින් රැස්කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත මාරුකරන ලද ආදායම රු.132,149,370,807 ක් වී තිබුණි. ඒ අනුව රැස්කර තිබුණු ආදායමෙන් සියයට 27 ක් වෙනත් ආයතන විසින් රැස්කළ ආදායම විය.

### 3.4.6 ආදායම් ගිණුම්ගත කිරීමේ වැරදි නිවැරදි කිරීම

2013 වර්ෂයේදී වැරදි ආදායම් සංකේතවලට ලැබී තිබුණු රු.15,281,672 ක්වූ බදුවලින් එකතුව රු.138,400 ක්ද, අංශ හඳුනා නොගත් රු.987,135,632 ක්වූ බදු ලැබීම්වලින් එකතුව රු.46,567,342 ක් ද, 2014 වර්ෂයේදී වැරදි ආදායම් සංකේතවලට ලැබී තිබුණු රු.6,352,277 ක්වූ බදුවලින් එකතුව රු.3,448,749 ක්ද, අංශ හඳුනා නොගත් රු.579,810,204 ක්වූ බදු ලැබීම්වලින් එකතුව රු.73,350,901 ක්ද, 2015 අගෝස්තු 20 දින වන විටත් නිරවුල් කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය විය.

### 3.4.7 භාණ්ඩාගාරයේ ගිණුම සමඟ දෙපාර්තමේන්තු ගිණුම් නොසැසඳීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෑම ඉකුත් වර්ෂයකදීම භාණ්ඩාගාරයේ ආදායම් වාර්තා සහ දෙපාර්තමේන්තුවේ ආදායම් වාර්තා අතර වෙනස්කම් පැවති අතර ඒ ඒ වර්ෂවලදී එම නොගැලපීම්වලට/ විෂමතාවයන්ට හේතු සොයා බලා නිවැරදි කිරීමට (ගිණුම් අතර සැසඳීම් කිරීමට) කටයුතු කර නොතිබුණි. එම නිසා පසුගිය වර්ෂවල ගිණුම් සාරාංශ මඟින් සහ ආදායම් ගිණුම්වල දක්වා තිබුණු ආදායම් දත්ත පිළිබඳව පමණක් නොව මහ බැංකු වාර්තා මඟින් ඉදිරිපත් කළ ආදායම් දත්තවලද යම් විෂමතාවයන්/නොගැලපීම් සහ දත්තවල නිවැරදිතාවය පිළිබඳ ප්‍රශ්නකාරීවීම් පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ආදායම් ගිණුම් තැබීමේදී එකතු කළ අගය මත බදු සඳහා 10.02.01.00 දරන පාලන ගිණුමද, භාණ්ඩ හා සේවා බදු සඳහා 10.02.02.00 දරන පාලන ගිණුමද අනෙකුත් සියළු බදු සඳහා 10.04.02.99 දරන පාලන ගිණුමද පවත්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදීද දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු බදු එකතු කිරීමේ වාර්තා අනුව ඉහත පාලන ගිණුම් තුනෙහි ශේෂයන් සහ භාණ්ඩාගාර වාර්තා අනුව පැවති ශේෂ අතර පහත සඳහන් පරිදි වෙනස්කම් පැවතුණි.

| ආදායම් පාලන ගිණුම් විස්තර | දෙපාර්තමේන්තු වාර්තා අනුව ආදායම | භාණ්ඩාගාරයේ පරිගණක වාර්තා අනුව ආදායම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 10.02.01.00 | 136,720,428,707 | 136,708,072,672 | (12,356,035) |
| 10.02.02.00 | 3,462,440 | 3,459,764 | 2,676 |
| 10.04.02.99 | 229,136,640,087 | 229,083,257,926 | (53,382,161) |

ඉහත වෙනස්කම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා තිබුණු මාසික ගිණුම් සැසඳීම වාර්තාවට අනුව (Table 66) සෑම මාසයකදීම දෙපාර්තමේන්තුවේ ආදායම් වාර්තා අනුව බදු ආදායම සහ භාණ්ඩාගාර වාර්තා අනුව බදු ආදායම සැසඳී තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුවේ ආදායම් වාර්තා අනුව ආදායම සහ භාණ්ඩාගාරයේ පරිගණක වාර්තා අනුව ආදායම අතර ඉහත දැක්වෙන වෙනස්කම් පැවැතුණි. දෙපාර්තමේන්තුවේ ආදායම් වාර්තා සහ භාණ්ඩාගාර ආදායම් වාර්තා අතර මාසිකව සැසඳීම් කර එම ආදායම් වාර්තා සැසඳෙන බවට රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර තිබුණු ප්‍රකාශය පිළිගැනීමට නොහැකි විය.

(ii) දෙපාර්තමේන්තුවේ ආදායම් වාර්තා අනුව සහ භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව අංක 10.02.01.00 දරන පාලන ගිණුමේ පැවති රු.12,356,034 ක් වූ වෙනසට හේතු සොයා බලා කටයුතු කළ යුතු වුවත්, ඒ වෙනුවට එම මුදල ආපසු ගෙවීම් ලෙස (Refund) ආදායම සංකේත අංක 10.02.01.02 හි ආදායමෙන් අඩුකර තිබුණි.

(iii) දෙපාර්තමේන්තුවේ ආදායම් වාර්තා අනුව සහ භාණ්ඩාගාර වාර්තා අනුව අංක 10.04.02.99 දරන පාලන ගිණුමේ පැවති රු.53,382,161 ක් වූ වෙනසට හේතු සොයාබලා ගැලැපීම වෙනුවට එම ආදායම් සංකේතයෙන් නැවත එම මුදල අඩු කර දක්වා තිබුණි.

(iv) දෙපාර්තමේන්තුවේ ආදායම් සංකේත 10.04.02.99 දරන පාලන ගිණුමේ රු.229,136,640,087 ක් වූ මුළු ආදායම තුළ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ

ජනරාල්වරයාගේ ආදායම් සංකේත 10.02.10.00 ට අයත් රු.84,655,276 ක් ද ඇතුළත්ව තිබුණි.

### 3.4.8 භාණ්ඩාගාරය විසින් බදු ආපසු ගෙවීම්

සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර පරිගණක වාර්තාවල සඳහන් පරිදි භාණ්ඩාගාරය විසින් එකතුව රු.11,339,155,267 ක් වූ බදු ආපසු ගෙවා තිබුණි. එහි සංයුතිය පහත පරිදි විය.

| බදු වර්ගය | සෘජු ගෙවීම් | වැරදි ගැලැපීම් | පළාත් සභාවලට මාරු කිරීම් | විස්තර නොමැතිවීම් | වෙනත් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 10.02.01.02 | - | 26,517 | - | - | 12,819,516 |
| 10.02.02.02 | - | - | - | - | 2,676 |
| 10.02.07.00 | - | - | 3,592,693,757 | - | - |
| 10.02.12.03 | 7,993,890 | 103,548 | - | 7,664,390,205 | - |
| 10.03.04.00 | - | 633,258 | - | - | - |
| 10.04.02.99 | 7,109,740 | - | - | - | 53,382,160 |
| එකතුව | **15,103,630** | **763,323** | **3,592,693,757** | **7,664,390,205** | **66,204,352** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතිය ගොඩනැඟීමේ බදු රැස් කිරීමේ ආදායම් ගණන්දීමේ නිලධාරී දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් බැවින් රැස් කරන ලද ජාතිය ගොඩනැඟීමේ බදු ආපසු ගෙවීමද ඔහු විසින් සිදු කළ යුතු වුවත් රේගු දෙපාර්තමේන්තුව විසින් එකතු කර තිබුණු බදුවලින් රු.7,993,890 ක් සෘජුවම එම දෙපාර්තමේන්තුව විසින් පළාත් සභාවලට ආපසු ගෙවා තිබුණි.

තවද, රේගු දෙපාර්තමේන්තුවෙන් ආපසු ගෙවීම් ලෙස දක්වා තිබුණු රු.7,664,390,205 ක් සඳහා විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර වාර්තා අනුව ආදායම, දෙපාර්තමේන්තු වාර්තා අනුව ආදායමට සමාන කිරීම සඳහා එකතුව රු.66,204,352 ක් වූ මුදල ආපසු ගෙවීම් ලෙස දක්වා දෙපාර්තමේන්තු බදු ආදායමට ගැලපීම් කර තිබුණි.

### 3.4.9 මතභේදයට තුඩු දෙන හර බදු ආපසු ගෙවීම්

අංක 7002/0000/00/00/69/00/0214/000 දරන දෙපාර්තමේන්තුවේ අග්‍රිම ගිණුමට 2014 දෙසැම්බර් මාසයේ දී භාණ්ඩාගාරය විසින් හර කර තිබුණු රු.5,499,000 ක් වූ මුදල හර බදු ආපසු ගෙවීමක් ලෙස 2015 ජනවාරි 21 දිනැති අංක IOD/CM/MIS/14 දරන භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් දන්වා තිබුණ ද, මුදල් රෙගුලාසි 118 හා 205 ප්‍රකාර මෙලෙස අග්‍රිම ගිණුම හරකර බදු ආපසු ගෙවීමට හැකියාවක් නොතිබුණි. එසේම හර බදු පනත අනුව හර බදු ආපසු ගෙවීමේ බලය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරි තිබුණු බැවින් භාණ්ඩාගාරය විසින් අග්‍රිම ගිණුමට රු.5,499,000 ක් හර කිරීම මතභේදයට තුඩු දෙන ගනුදෙනුවක් වී තිබුණි.

තවද හර බද්ද 2011 අප්‍රේල් 01 දින සිට අවලංගු කර තිබූ බද්දක් වන බැවින් ද, එම මුදල සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් මාසය දක්වා ක්‍රියාමාර්ග නොගැනීම ද, එම හර බද්ද අයවී ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි නොතිබීමද ප්‍රශ්නකාරී වේ.

### 3.4.10 බැංකුවලට ගෙවන ලද බදු සඳහා ගෙවීම් ප්‍රේෂණ පත්‍ර නොලැබීම

සමාලෝචිත වර්ෂයේදී ආදායම් රැස්කිරීමේ ගිණුම්වලට බැර කර තිබුණු පහත විස්තර දැක්වෙන බදු වර්ග සඳහා බදුකරුවන් විසින් බැංකුව වෙත ඉදිරිපත් කරන ලද ගෙවීම් ප්‍රේෂණ පත්‍ර, බැංකුව විසින් දෙපාර්තමේන්තුවට එවා නොතිබුණි. ගෙවීම් ප්‍රේෂණ පත්‍ර නොමැතිවීම නිසා බදුකරුවන් විසින් ගෙවන ලද බදු මුදල්, අදාල බදුකරුවන්ගේ ගිණුම්වලට සටහන් කර නොතිබුණි.

| බදු වර්ගය | ගිණුම් අංකය | ගෙවීම් පත්‍රිකා නොමැතිව ගිණුම්වලට බැරවී තිබුණු මුදල | 2014 වර්ෂයේදි ලැබී තිබුණු ප්‍රමාණය | 2015 මැයි 28 දින වන විටත් ගෙවීම් ප්‍රේෂණ පත්‍ර නොමැති විම නිසා ගිණුම්ගත වි නොතිබුණු වටිනාකම |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| එකතු කළ අගය මත බදු | 2026647 | 104,464,161 | 60,999,413 | 43,464,748 |
| ආදායම් බදු | 2026527 | 25,615,978 | 16,511,352 | 9,104,626 |
| ආර්ථික සේවා ගාස්තු | 2026713 | 12,584,800 | 12,254,077 | 330,723 |
| ජාතිය ගොඩනැඟීමේ බදු | 7041556 | 42,746,310 | 25,305,643 | 17,440,667 |

**3.4.11 බදු පනත් වලින් පැන නැගී ඇති ගැටලු**

පහත සඳහන් නිරීකෂණයන් කරනු ලැබේ.

(අ) හිඟ බදු පවතින සමහර බදුකරුවන් තම ව්‍යාපාර වසාදමා නැවත වෙනත් නමකින් (සමාගමක් ලෙස) එම ලිපිනයෙන්ම බදු සඳහා ලියාපදිංචි වී තිබුණු අවස්ථා පැවතුණි. මෙහිදී ව්‍යාපාරයක් වැසීමෙන් පසු එම අයිතිකරු නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී දෙපාර්තමේන්තුව විසින් පෙර පැවති ව්‍යාපාර පිළිබඳ බදු නිෂ්කාශන සහතිකයක් (tax clearance certificate) ලබා ගත යුතු බවට විධිවිධාන සකස් කිරීම මඟින් පවතින හිඟ බදු අවම කර ගැනීමට ඉඩකඩ සැලසෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) දේශීය ආදායම් පනතේ 102(1) වගන්තිය අනුව යම් තක්සේරු වර්ෂයක් තුළ රාජ්‍ය නොවන සංවිධානවලට ලැබෙන අරමුදල්වලින් සියයට 3 ක් එම තක්සේරු වර්ෂය සඳහා රාජ්‍ය නොවන සංවිධානයේ ලාභ සහ ආදායම ලෙස සැලකිය යුතු අතර එම ප්‍රමාණය මත සියයට 28 ක බද්දක් (2014 අප්‍රේල් 01 දින සිට) අයකළ යුතු වේ. තවද එම ආයතන විසින් කාර්තුමය පදනම මත ආදායම් වාර්තා දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවූ රාජ්‍ය නොවන සංවිධාන 359 ක් තිබුණද, 2011 ජූලි 22 දිනැති අංක 2011/04 දරන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 4 (III) ඡේදය ප්‍රකාරව එම සංවිධාන විසින් අරමුදල් ලැබීම් පිළිබඳව කාර්තුමය වාර්තා ඉදිරිපත් කර නොතිබුණ අතර, ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගැනීමක්ද සිදු කර නොතිබුණි.

**3.4.12 ඵලදායී අනුපාතය**

විසර්ජන ගිණුමට අනුව 2014 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මුළු වියදම රු.3,087,962,992 ක් වූ අතර අදායම් ගිණුම අනුව තථ්‍ය බදු ආදායම රු.485,387,055,372 ක් විය. ඒ අනුව ඵලදායී අනුපාතය 157:1 ක් හෙවත් රුපියල් 100 ක් රැස් කිරිමේ පිරිවැය ශත 64 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයේ ඵලදායී අනුපාතය 249:1 ක් හෙවත් රු.100 රැස් කිරීමේ පිරිවැය ශත 40 ක් වි තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රුපියල් 100 ක බදු එකතු කිරීමේ පිරිවැය ශත 24 කින් වැඩි වී තිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

විෂයය අංක 24601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.273,820,300 ක් වූ අතර, එහි ඇතුළත් රු.3,050,162 ක් වූ හිඟහිටි ශේෂ සඳහා වර්ෂ 01 සිට වර්ෂ 05ක් දක්වා කාල පරාසයක් ගතවී තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක් පැවතුණි.

(ආ) 2012 සැප්තැම්බර් 18 දින මියගිය නිලධාරිණියකගෙන් අයවිය යුතු රු.191,514 ක් වූ දේපල ණය ජාතික රක්ෂණ භාර අරමුදලෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වැඩ තහනම්ව සිටි නිලධාරීන් 03 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු රු.552,702 ක් වූ මුදලින්, දිරිදීමනා වලින් රු.313,012 ක් 2015 වර්ෂයේදී අයකර ගෙන තිබුණ ද ඉතිරි රු.239,690 ක් අය කර නොතිබුණි.

(ඈ) සේවය හැරගිය නිලධාරින් 5 දෙනෙකුගේ අයවිය යුතු රු.496,660 ක් වූ ණය ශේෂ වලින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් අය කර නොතිබුණි.

(ඉ) සේවකයෙකුට රු.252,045 ක් වූ දේපල ණය ප්‍රදානය කිරීමේදී ඔහුගේ නමට ඉඩමේ ඔප්පුව ලියා ඇටෝනි බලය ලියාපදිංචි නොකිරීම නිසා 1999 වර්ෂයේදී ඔහු සේවය හැර ගිය පසු එම ණය ශේෂය අයකර ගැනීමට නොහැකි වි තිබුණි.

(ඊ) 1996 වර්ෂයට පෙර කාලයට අයත් රු.230,534 ක් වූ ණය ශේෂවලට අදාල ලිපිගොනු හා විස්තර සොයා ගැනීමට නොහැකි වූ බව දන්වා තිබුණු බැවින් එම ණය ශේෂ අය නොවන ණය ශේෂ බවට පත් වී තිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**3.6.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්වලට අදාල අංක 246-1-1-2002 වැය විෂය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනය රු.2,500,000 ක් වී තිබුණත්, ප්‍රසම්පාදන සැලැස්මේ ඒ සඳහා වන ප්‍රසම්පාදන ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2014 සංශෝධිත අයවැය ඇස්තමේන්තු අනුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර නොතිබුණි.

**3.6.2 විගණන හා කළමනාකරණ කමිටුව**

**-----------------------------------**

විගණන හා කළමනාකරණ කමිටුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති අතර 2014 වර්ෂය සඳහා කමිටු රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

**---------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතිණි.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හා උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර | 02 | දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේදී සපයා තිබුණු එම යන්ත්‍ර දෙක 2009 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණි. |
| සී.සී.ටී.වී.කැමරා | 70 | 2010 වර්ෂයේදී දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේදී ගොඩනැගිල්ලේ මහල්වලට සී.සී.ටී.වී.කැමරා සවිකර තිබුණු නමුත් ඒවා භාවිතයට ගෙන නොතිබුණි. |

**(ආ) ලැබිය යුතු ශේෂ**

කොළඹ 12 ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ඉඩමේ පර්චස් 100 ක ඉඩම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සඳහා 2008 පෙබරවාරි 28 දින රුපියල් මිලියන 50 ක් සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ සභාපති වෙත ගෙවා තිබුණි. එම දේපල පවරා ගැනීම නවතා තිබුණද එම අත්තිකාරම් මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් ලෙස විසර්ජන ගිණුමේ දක්වා තිබුණු රු.46,641,222 ක් වූ බැරකම්වලට අතිරේකව රු.1,619,198 ක් වූ බැරකම් ද පැවතුණි.

## 3.8 අනුකූල නොවීම

### (අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(i)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 94 | වැය විෂයයන් 10 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.38,599,221 ක බැරකම්වලට එළඹ තිබුණි. |
| **(ii)** | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| | 5.4.12 මාර්ගෝපදේශය | එකතු කළ අගය මත බදු රාජ්‍ය ආයතන විසින් ගෙවීම් කරන විට, ඒ පිලිබඳ විස්තර ගෙවීම් කළ මාසයට පසුව එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිට පිටපතක් සමඟ දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට යැවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ආයතන 89 ක් විසින් පමණක් එම තොරතුරු ඉදිරිපත් කර තිබුණි. අනෙකුත් ආයතනවලින්ද එම තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි. |

### (ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියා කළ අවස්ථා පහත දැක්වේ.

**(i) එකතු කළ අගය මත බදු සඳහා වාර්තා ඉදිරිපත් නොකිරීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- බදුකරුවන් දෙදෙනෙකුට රාජ්‍ය ආයතන දෙකක් විසින් එකතුව රු.6,706,375 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවා තිබුණ ද බදුකරුවන් එම බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවා නොතිබුණි.
- අක්‍රිය බදුකරුවන් ලෙස පරිගණක පද්ධතියේ දක්වා තිබුණු බදුකරුවන් 06 දෙනෙකුට එකතු කළ අගය මත බදු වශයෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් ගෙවා තිබුණු රු.943,143 ක බදු මුදල දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

**(ii) හිඟබදු අයකර ගැනිමට කටයුතු කරන බව දන්වා ඇතත් අදාල හිඟබදු අයවී නොතිබීම**

---

බදුකරුගේ 2007/08 වර්ෂය සඳහා වූ හිඟව පැවති රු: 449,448,567 ක් වූ එකතු කළ අගය මත බදු සහ රු.642,393,631 ක් වූ ආදායම් බදු නිරවුල් කර නොතිබුණි.

**(iii) බදු ලිපිගොනු පරීක්ෂාව**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- බදුකරුවෙකුගෙන් 2010 අප්‍රේල් 01 දින සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බද්දෙන් වියදම් ලෙස අඩු කල යුත්තේ 1/3 ක් පමණක් වූවද රු. 999,871 ක් වූ සම්පූර්ණ මුදලම අඩු කර තිබුණි.
- බදුකරුවෙකු විසින් 2009/10, 2010/11 සහ 2011/12 වර්ෂ සඳහා අඩුවෙන් දක්වා තිබුණු එකතුව රු.180,652,889 ක් වූ ආදායම මත, රු.7,178,027 ක් වූ අතිරේක බද්දක් ගෙවීමට බදුකරු එකඟවී තිබුණද 2015 ඔක්තෝබර් 31 දින වන විටත් එම බදු මුදල අය වී නොතිබුණි.
- බදුකරුවෙකුගෙන් 2006/07, 2007/08, 2008/09 සහ 2009/10 වර්ෂ සඳහා අයවිය යුතුව තිබුණු එකතුව රු.207,967,965 ක් වූ ආදායම් බදු, වැඩිපුර

ගෙවන ලද බදු වලින් හිලව් කිරීම, වෙනත් කාලපරිච්ඡේදයකට බැරවීම් මඟින් ගැලපීම් කිරීම හා අභියාචනා මඟින් විසඳීම යන ක්‍රියාමාර්ග මඟින් අය කරගෙන නොතිබුණි.

- බදුකරුවෙකු විසින් එකතු කළ අගය මත බදු වශයෙන් 07031 සිට 08123 දක්වා කාලය සඳහා පැවති රු.573,262,517ක් සඳහා ඉදිරිපත් කරන ලද අභියාචනා පිළිගෙන තිබුණ ද නිකුත් කරන ලද එම තක්සේරු දැන්වීම් අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය**

2009 වර්ෂයේදී දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණය කිරීමේදී ඉදිකිරීමට ඇස්තමේන්තු කර තිබුණු මහල් 09 කින් යුත් රථ වාහන අංගනයේ ඉදිකිරීම 2014 දෙසැම්බර් 31 දිනට පෙර අවසන් කරන බවට ලිඛිතව පොරොන්දු වී තිබුණත්, රාජ්‍ය සංස්ථාවකට එම කොන්ත්‍රාත්තුව පිරිනමා වසර 05ක් ගත වී තිබුණත් එහි ඉදිකිරීම් කටයුතු 2015 ඔක්තෝබර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

**3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

දෙපාර්තමේන්තුවේ බදු ආදායම රැස් කිරීම් සඳහා පවත්වා තිබුණු බැංකු ගිණුම් 33ට අදාල බැංකු සැසඳුම් සකස් කර නොතිබුණි.

**3.11 අවිධිමත් ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු අවිධිමත් ස්වරූපයේ ඒවා විය. එවැනි ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

**(අ) ආරක්ෂක සේවය ලබා ගැනීමේ කොන්ත්‍රාත්තුව වැඩි මිලකට ලබා දීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවේ ආරක්ෂක සේවාව රු.19,302,360 ක වාර්ෂික කුලියකට 90 දෙනෙකුගෙන් යුත් ආරක්ෂක කාර්ය මණ්ඩලයක් යොදවා ගැනීමට හැකියාව තිබුණත්, වර්ෂයකට රු.34,686,240 ක් අය කරන සමාගමකට ආරක්ෂක සේවා

කොන්ත්‍රාත්තුව ලබා දීම හේතුවෙන් වර්ෂයකට රු.15,383,880 ක් වැඩියෙන් ගෙවීමට සිදු වී තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1:2 වගන්තිය ප්‍රකාරව කටයුතු නොකර 2010 අගෝස්තු 12 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 445 ප්‍රකාරව කටයුතු කිරීම හේතුවෙන් විවෘත ලංසු කැඳවීමකින් තොරව ආරක්ෂක සේවා සැපයීම් සඳහා එම සමාගම තෝරා ගෙන තිබුණි.

**(ආ) දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණය වෙනුවෙන් මුදල් ගෙවීම**

**-----------------------------------------------------------------------------**

2009 ජූලි 09 දින දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රාජ්‍ය සංස්ථාවකට ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාජ්‍ය සංස්ථාව විසින් වෙනත් කොන්ත්‍රාත්කරුවන් ලවා ඉටුකර තිබුණු නවීකරණ කාර්යයන්වල අඩුපාඩු සම්පූර්ණ කර නොතිබියදීත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට මුදල් ගෙවා තිබීම.

(ii) මෙම කොන්ත්‍රාත්තුවේ උපදේශක කාර්යය සඳහා රු.49,580,000 ක් එම රාජ්‍ය සංස්ථාවටම ගෙවා තිබියදී ඊට අතිරේකව රජයේ උපදේශක කාර්යාංශයකටද රු.1,250,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින්ම උපදේශක ලෙස කටයුතු කිරීම නිසා කොන්ත්‍රාත් කාර්යයන්හි සිදුවන අඩුපාඩු අනාවරණය වීමක් ද සිදු වී නොතිබුණි.

(iii) මෙම කොන්ත්‍රාත්තුව යටතේ වූ වාහන අංගනය ඉදි කිරීමේ කටයුතු ප්‍රමාද වීම නිසා වාහන නවතා තැබීමේ ස්ථානයක් කුලියට ගැනීම සඳහා 2013 සහ 2014 වර්ෂවලදී රු.3,285,000 ක් ගෙවා තිබුණි.

**3.12 අනාර්ථික ගනුදෙනු**

**----------------------**

**පෙර ගෙවුම් කාඩ්පත් ලබා ගැනීම**

**-----------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2013 ජූනි 21 දින සිට රු.100,000 ක් වූ පෙර ගෙවුම් කාඩ්පතක් වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් ලබාගෙන එම මුදල ලංකා බැංකුවේ පෙර ගෙවුම් කාඩ්පත් ගිණුම බැරකර තිබුණි. එම පෙර ගෙවුම් කාඩ්පත් ගිණුමෙන් 2013 සහ 2014 වර්ෂවලදී කිසිදු වියදමක්

කර නොතිබුණු බැවින් පෙර ගෙවීම් කාඩ්පත සඳහා වාර්ෂිකව රු.100,000 ක් බැගින් ලබා ගෙන තිබුණු මුදල නිෂ්ක්‍රීය මුදල් බවට පත්වී තිබුණි.

## 3.13 මානව සම්පත් කළමණාකරණය

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,250 | 1,152 | 98 | - |
| (ii) | තෘතියික මට්ටම | 24 | 130 | - | 106 |
| (iii) | ද්විතියික මට්ටම | 1,052 | 585 | 467 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 397 | 372 | 25 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම ) | - | 02 | - | 02 |
| | **එකතුව** | **2,723** | **2,241** | **590** | **108** |

ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා ද්විතීක මට්ටමේ තනතුරු 565 ක් එනම් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 25 ක පුරප්පාඩු පැවතියත්, එම පුරප්පාඩු පිරවීමට අපොහොසත් වී තිබුණි. තෘතියික මට්ටමේ තනතුරු 106 ක අතිරික්තය සඳහා අනුමැතිය ලබා ගැනිමට අපොහොසත් වී තිබුණි.